# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2270/25 - 2022 මාර්තු මස 09 වැනි බදාදා - 2022.03.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

**පුදුකුඩිඉරුප්පුව ප්‍රාදේශීය සභාව**

පුදුකුඩිඉරුප්පුව ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි පහත සඳහන් ප්‍රදේශය දියුණුකල ප්‍රදේශය
වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව පුදුකුඩිඉරුප්පුව ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි සහ පහත උපලේඛනයේ සඳහන් කරන ලද ග්‍රාම සේවක කොට්ඨාස, දියුණුකල ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කරන බව 2022 වර්ෂයේ පෙබරවාරි මස 10 වැනි දිනැති අංක 21 දරන සභාවේ යෝජනාව අනුව පුදුකුඩිඉරුප්පුව ප්‍රාදේශීය සභාවෙන් තීරණය කරන ලදී.

"පුදුකුඩිඉරුප්පුව ප්‍රාදේශීය සභාවේ දියුණුකල ප්‍රදේශ වශයෙන් 2022.03.07 වැනි දින සිට බලපවත්වන පරිදි ඉහත නීතිය අනුව ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත පවරන ලද බලතල අනුව මුලතිව් පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සහකාර කොමසාරිස් චන්ද්‍රසේකරන් යසින්දන් වන මා අනුමැතිය ලබා දෙමින් මෙයින් ප්‍රකාශයට පත් කරමි."

**චන්ද්‍රසේකරන් යසින්දන්,**
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්.

2022 මාර්තු මස 07 වැනි දින,
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,
මුලතිව් දිස්ත්‍රික්කය.

1A - P 5776 — 15 (2022/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

**දියුණු කල ප්‍රදේශය**

| *අංකය* | *කොට්ඨාසයේ නම සහ අංකය* | *ග්‍රාම සේවක කොට්ඨාසය* | *ග්‍රා. සේ. කො. අංකය* | *පර්චස් වර්ග කි.මී.* | *කොට්ඨාස මායිම්* |
|---|---|---|---|---|---|
| 1 | විසුවමඩු | 1. විසුවමඩු බටහිර<br>2. විසුවමඩුව නැගෙනහිර | Mull/49<br>Mull/50 | 81.6 | උතුරුඃ කිලිනොච්චි දිස්ත්‍රික්කය<br>නැගෙනහිර : මාණික්කපුරම් ග්‍රාම සේවක කොට්ඨාසයේ බටහිර සහ දකුණ මායිම් සහ තේරාවිල් ග්‍රාම සේවක කොට්ඨාසයේ බටහිර මායිම්<br><br>දකුණඃ තච්චාඩම්බන් සහ තේරාවිල් ග්‍රාම සේවක කොට්ඨාසයේ නැගෙනහිර මායිම්<br><br>බටහිර : කිලිනොච්චි දිස්ත්‍රික්කය |
| 2 | උඩයාර්කට්ටු | 1. උඩයාර්කට්ටු උතුර<br>2. උඩයාර්කට්ටු දකුණ | Mull/46<br>Mull/47 | 34.1 | උතුර : කිලිනොච්චි දිස්ත්‍රික්<br>මායිම් සහ සුදන්දිරපුරම් ග්‍රාම සේවක කොට්ඨාසයේ බටහිර සහ දකුණ මායිම්<br><br>නැගෙනහිරඃ තේව්පුරම් සහ වල්ලිපුරම් ග්‍රාම සේවක කොට්ඨාසයේ බටහිර මායිම්<br><br>දකුණ : මුත්තයන්කට්ටු කුලම් සහ මනවාලන්පට්ටමුරිප්පු ග්‍රාම සේවක කොට්ඨාසයේ උතුරු මායිම්<br><br>බටහිර : තච්චාඩම්බන් සහ තේරාවිල් ග්‍රාම සේවක කොට්ඨාසයේ නැගෙනහිර මායිම් |
| 3 | පුතිදවල නගර් | 1. සිවනගර්<br>2. මන්දුවිල<br>3. මල්ලිගයිතීවු<br>4. ආනන්දපුරම්<br>5. ඉණෛයිප්පා-ලෙයි | Mull/37<br>Mull/38<br>Mull/39<br>Mull/40<br>Mull/43 | 21.3 | උතුර : මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය සභාව මායිම්<br><br>නැගෙනහිර : මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය සභා සීමාව<br>දකුණ : මුහුදුබඩපත්තුව මායිම් සහ පුදුකුඩිඉරුප්පුව නැගෙනහිර ග්‍රාම සේවක කොට්ඨාසයේ නැගෙනහිර මායිම<br><br>බටහිර : පුදුකුඩිඉරුප්පුව නැගෙනහිර සහ තේරාවිල් ග්‍රාම සේවක කොට්ඨාසයේ නැගෙනහිර මායිම් |

EOG 03-0798

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.